# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1352/21 – 2004 අගෝස්තු 05 වැනි බ්‍රහස්පතින්දා – 2004.08.05

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### ආණ්ඩුවේ නිවේදන

එල්. ඩී. බී. 21/78.

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 18 වන වගන්තිය සමග කියවිය යුතු 23(2) වගන්තිය යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සාදනු ලැබූ නියමාවලිය.

ලේකම්,
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව.

2004ක් වූ ජූලි මස 16 වැනි දින,
කොළඹ දී ය.

නියමාවලිය

1. මෙම නියමාවලිය 2004 අංක 01 දරන ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාල (සංශෝධන) නියමාවලිය යනුවෙන් සඳහන් කරනු ලබන අතර, එය 2003 පෙබරවාරි මස 1 වන දින සිට ක්‍රියාත්මක විය යුතු ය.

2. 1990 ජනවාරි මස 5 වැනි දින අංක 591/18 දරන *අති විශෙෂ ගැසට්* පත්‍රයෙහි පළකරන ලද 1990 අංක 1 දරන ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාල නියමාවලිය, එහි 16 වන ඡේදය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ.

(1) එම ඡේදයේ (1) වන අනුඡේදය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :-

"(1) විවෘත විශ්වවිද්‍යාලයේ පහත දැක්වෙන පීඨ තිබිය යුතු ය :-

(අ) මානව හා සමාජ විද්‍යා පීඨය ;

(ආ) ස්වභාවික විද්‍යා පීඨය ;

(ඇ) ඉංජිනේරු තාක්ෂණ පීඨය ; සහ

(ඈ) අධ්‍යාපන පීඨය.".

1A-G 004630 - 690 (2004/08)

(2) එම ඡේදයේ (2) වන අනුඡේදයේ (1) වන අයිතමය ඉවත් කිරීමෙන් ;

(3) එම ඡේදයේ (5) (6) සහ (7) යන අනුඡේද පිළිවෙලින් (6), (7) සහ (8) යනු අනුඡේද වශයෙන් නැවත අංක යෙදීමෙන් ; සහ

(4) එම ඡේදයේ (4) වන අනුඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් අනුඡේදය ඇතුළත් කිරීමෙන් :-

"(5) අධ්‍යාපන පීඨයෙහි පහත දැක්වෙන අධ්‍යයන අංශ තිබිය යුතු ය :-

(i) අධ්‍යාපන ;

(ii) ළදරු අධ්‍යාපනය ; සහ

(iii) විශේෂ අධ්‍යාපනය. ".

08-973

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.